# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## පස්වන ශ්‍රේණිය (පළමුවන වාරය)

## 2022

**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල පළමුවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් පළමුවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අපි විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව පළමුවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සැම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්නව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය.

**මව්බස = සිංහල**
**පස්වන ශ්‍රේණිය (පළමුවන වාරය)**

පස්වන ශ්‍රේණියේ පළමුවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය ම විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

පස්වන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර හතරවන ශ්‍රේණියේ දී මව්බස විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව පස්වන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඒ අනුව දෙවන ප්‍රධාන අවධියේ උගත් පරිදි තනිරූලේ හතරෙන් තුන ප්‍රමාණයට අකුරු ලිවීම සඳහා පිලි රහිත වචන බලා ලිවීම සහ අසා ලිවීමට අදාළ අභ්‍යාස ඔබ විසින් සකස් කර ලබා දිය යුතු ය.

නිශ්ශබ්ද ව කියවීමේ දී කියවීම තක්සේරු කිරීමට වාචික සහ ලිඛිත ප්‍රශ්න විමසිය හැකි ය.

ඒ අනුව පළමුවන වාරය සඳහා නිර්දිෂ්ට තුන්වන සහ හතරවන නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

පස්වන ශ්‍රේණිය -. මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $L_1$ - අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.<br><br>$S_1$ . අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | • පවසන දෙයට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙයි.<br>• කතන්දරයක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට අවබෝධයෙන් යුතු ව ප්‍රතිචාර දක්වයි.<br>• සිද්ධි ගළපමින් නිර්මාණාත්මක ලෙස කතන්දරයක් ඉදිරිපත් කරයි.<br>• මාතෘකාවකට අදාළ ව නිවැරදි ව කතා කරයි. | • පවසන දෙයට සවන් දීම<br>• කතන්දරවලට සවන් දීම<br>• නිදහසේ කතන්දර පැවසීම<br>• මාතෘකාවකට අදාළ ව කතා කිරීම | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02<br><br><br>ක්‍රියාකාරකම 05<br><br><br>ක්‍රියාකාරකම 06 | 13<br><br>14,15,16<br><br><br>18,19<br><br><br>19,20 | මිනි. 30<br><br>මිනි. 30<br><br><br>මිනි. 30<br><br><br>මිනි. 30 |

පස්වන ශ්‍රේණිය -. මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $R_1$ - කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>$W_1$ . සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | • ශබ්දනගා හැඟීම් ප්‍රකාශ වන පරිදි කියවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.<br><br>• නිශ්ශබ්ද ව කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>• වචන අතර පරතරය තබමින් ලියයි.<br><br>• නිවැරදි ව පිළි යෙදීම පිළිබඳ ව කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරමින් ලියයි.<br><br>• අර්ථය නිවැරදි ව ප්‍රකාශ වන පරිදි ලියයි. | • කියවීමට සහ ලිවීමට හුරු කිරීම (4 වන ශ්‍රේණියට අදාළ ව තනි රූලේ 3/4 ප්‍රමාණයට අකුරු ලිවීමට දීම සඳහා බලා ලිවීමේ සහ අසා ලිවීමේ ක්‍රියාකාරකම්) | සකස් කරන ලද ක්‍රියාකාරකම් | | පැය 2 |

**පස්වන ශ්‍රේණිය මව්බස (සිංහල)**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| | • $R_1$.කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>• $W_1$.සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | • ශබ්දනගා කියවීමේ පරිචය ප්‍රදර්ශනය කරයි.<br><br>• ශබ්දනගා හැඟීම් ප්‍රකාශ වන පරිදි කියවීමේ කුසලතාව වර්ධනය කර ගනියි.<br><br>• නිශ්ශබ්ද ව කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>• නිවැරදි ව පිලි යෙදීම පිළිබඳ ව කුසලතාව ප්‍රදර්ශනය කරයි. | • කියවීමට සහ ලිවීමට හුරු කිරීම.<br><br>• තනි රූලේ 1/2 ප්‍රමාණයට ලිවීම. | • සිංහල අක්ෂර මාලාවේ අකුරු 60 තනි රූලේ ලිවීම<br><br>• මධ්‍ය අක්ෂර තනිරූලේ ලිවීම<br><br>• ආරෝහණ අක්ෂර තනිරූලේ ලිවීම<br><br>• අවරෝහණ අක්ෂර තනිරූලේ ලිවීම | 21 ,22 | 02 |
| 'ආ' සිට 'ඖ' තෙක් ශබ්ද සඳහා පිල්ලම් යෙදෙන වචන අසා ලියයි | | | • පිලි සහිත අකුරු යෙදුණු වචන සහිත වාක්‍ය කියවීම හා ලිවීම<br><br>• පිලි සහිත වචන ඇතුළත් සරල ඡේද කියවීම. | • පිලි සහිත අකුරු යෙදුණු වචන සහිත වාක්‍ය කියවීම හා ලිවීම ක්‍රියාකාරකම 1, 2, 3, 4<br>• පිලි සහිත අකුරු යෙදුණු වචන සහිත සරල ඡේද කියවීම සහ ලිවීම. ක්‍රියාකාරකම 1, 2, 3 | 23-25<br><br>26-30 | 6<br><br>4 |

පස්වන ශ්‍රේණිය මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| | | | විරාම ලකුණු සැලකිල්ලට ගෙන කියවීම හා ලිවීම<br><br>• තිත<br>• ප්‍රශ්නාර්ථ ලකුණ<br>• කොමාව<br>• යුගල උඩු කොමාව<br>• විස්මයාදි ලකුණ<br>• සරල වරහන්<br>• කෙටි ඉර | <u>විරාම ලකුණු හඳුන්වා දීම</u><br>5 ශ්‍රේණිය සිංහල කියවීම පොතෙන් ශබ්දනගා කියවීමට සහ නිශ්ශබ්ද ව කියවීමට උචිත පාඩම් යොදා ගන්න.<br>උදාහරණ :<br>පාඩම 6<br>• මල් සිරි සිරි සිසිරි සිසිරි<br>පාඩම 11<br>• කොග්ගල චාරිකාව<br>පාඩම 13<br>• කැලෑවේ අන්තර්ජාලය<br><br>• ඉහත පාඩම් යොදා ගනිමින් විරාම ලකුණුවලට අනුගත ව කියවීම හා නිර්දිෂ්ට විරාම ලකුණු යෙදුණු වාක්‍ය සිංහල කියවීම පොතෙන් සොයා ලිවීම | 30. 31<br>32. 33 | 08<br><br>04 |

**පස්වන ශ්‍රේණිය මව්බස (සිංහල)**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| | $L_5$<br>• වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි.<br>$S_5$<br>• වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි.<br>$R_5$<br>• වාංමාලා සංවර්ධනය සඳහා කියවයි.<br>$W_5$<br>• වාංමාලා සංවර්ධනය සඳහා ලියයි. | • වාංමාලා පෝෂණය සඳහා වචන රැස් කර නිවැරදි ව භාවිත කරයි.<br>• යුගල පද, ප්‍රස්තාව පිරුළු, රූඪී/ ඉඟි වැකි සහ ආප්තෝපදේශ නිවැරදි ව අර්ථ ගැන්වීම සඳහා භාවිත කරයි. | • සමානාර්ථවත් පද | ක්‍රියාකාරකම (3)<br>• සමානාර්ථ පද හඳුනා ගෙන ලිවීම | 67<br>68<br>69 | 01 |
| | | | • විරුද්ධාර්ථවත් පද | ක්‍රියාකාරකම (4)<br>• විරුද්ධාර්ථ පද හඳුනා ගෙන ලිවීම | 69<br>70 | 01 |
| | | | • යුගල පද | ක්‍රියාකාරකම (5)<br>• යුගල පද හඳුනා ගෙන ලිවීම | 71<br>72 | 01 |
| | | | • ප්‍රස්ථාව පිරුළු | ක්‍රියාකාරකම (6)<br>• ප්‍රස්ථාව පිරුළු හඳුනා ගෙන ලිවීම | 72.73<br>74<br>75.76 | 01 |
| | | | • රූඪී/ඉඟි වැකි | ක්‍රියාකාරකම (6)<br>• රූඪී/ඉඟි වැකි හඳුනා ගෙන ලිවීම | 76<br>77<br>78 | 01 |
| | | | • ආප්තෝපදේශ | ක්‍රියාකාරකම (7)<br>• ආප්තෝපදේශ හඳුනා ගෙන ලිවීම | 79<br>80 | 01 |
| | | | • උපමා | ක්‍රියාකාරකම (8)<br>• උපමා හඳුනා ගෙන ලිවීම | 81<br>82<br>83 | 01 |
| | | | | | මුළු කාලය | පැය<br>35 |

## ගණිතය

## පස්වන ශ්‍රේණිය (පළමුවන වාරය)

ගණිතය විෂයමාලාවේ පස්වන ශ්‍රේණියේ පළමු වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

පස්වන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර හතරවන ශ්‍රේණියේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව පස්වන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න.
ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය පෙළ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳයි. | • ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා දෙකක් ගෙන යාම සහිත ව එකතු කිරීමේ ගැටලු විසඳයි.<br>• ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා තුනක් ගෙන යාම සහිත ව එකතු කිරීමේ ගැටලු විසඳයි. | • සංඛ්‍යා එකතු කිරීම | පාඩම් 3 ක්‍රියාකාරකම 1 සිට 4 | 12 සිට .18 | පැය 2 |
| | • පොදු අන්තරය 2 සිට 10 තෙක් වූ සංඛ්‍යා රටා ගොඩනගයි. | • පොදු අන්තරය 2 සිට 5 තෙක් වූ සංඛ්‍යා රටා ගොඩනගයි.<br>• පොදු අන්තරය 6 සිට 10 තෙක් වූ සංඛ්‍යා රටා ගොඩනගයි.<br>• දී ඇති සංඛ්‍යා රටා හඳුනා ගෙන තව දුරටත් ගොඩනගයි. | • සංඛ්‍යා රටා | පාඩම් 4 ක්‍රියාකාරකම 1 සිට 5 | 19 සිට 22 | පැය 5 |

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි. | • ඉලක්කම් හතරකට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කිරීමේ ගැටලු විසඳයි. | • සංඛ්‍යා අඩු කිරීම | පාඩම් 5<br>ක්‍රියාකාරකම 1 සිට 4 | 23 සිට 30 | පැය 5 |
| | • සම්පූර්ණ එකක සහ ද්‍රව්‍ය සමූහයක කොටසක් වශයෙන් දෙකෙන් පංගු සහ හතරෙන් පංගු දක්වයි. | • සම්පූර්ණ එකක කොටසක් වශයෙන් දෙකෙන් පංගු සහ හතරෙන් පංගු දක්වයි.<br>• ද්‍රව්‍ය සමූහයකින් 1/2ක් ද්‍රව්‍ය කීයක් ද යන්න ප්‍රකාශ කරයි.<br>• ද්‍රව්‍ය සමූහයකින් හතරෙන් පංගු එකක්, දෙකක් සහ තුනක් ද්‍රව්‍ය කීයක් ද යන්න ප්‍රකාශ කරයි. | • දෙකෙන් පංගු සහ හතරෙන් පංගු | පාඩම් 6<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 31 සිට 37 | පැය 3 |

පස් වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • ඉලක්කම් තුනකට නොවැඩි සංඛ්‍යා 2, 3, 4 සහ 5න් ගුණ කිරීමේ ගැටලු විසඳයි. | • 2, 3, 4 සහ 5 ගුණන වගු පිළිබඳ දැනුම භාවිත කරයි.<br>• ඉලක්කම් තුනකට නොවැඩි කවර හෝ සංඛ්‍යාවක් 2, 3, 4 සහ 5න් ගුණ කිරීමේ ගැටලු විසඳයි. (ගෙන යාම වරකට එක් අවස්ථාවක් පමණක් සහිත) | • 2, 3, 4 සහ 5න් ගුණ කිරීම | පාඩම් 7 ක්‍රියාකාරකම 2 සිට 5 | 40 සිට 43 | පැය 4 |
| | • ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි. | • පැය දොළහේ ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි.<br>• පැය හා මිනිත්තු ඇසුරෙන් වේලාව ප්‍රකාශ කරයි.<br>• පෙරවරු සහ පස්වරු භාවිතයෙන් වේලාව කියයි.<br>• වේලාව පැය 24 ඔරලෝසුවෙන් (අන්තර්ජාතික සම්මත ආකාරයට) ප්‍රකාශ කරයි. | • පැය 12 සහ 24 ඔරලෝසුවේ වේලාව කියවීම | පාඩම් 8 ක්‍රියාකාරකම 1 සිට 4 | 44 සිට 50 | පැය 4 |

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | • සංඛ්‍යා බෙදීමේ ගැටලු විසඳයි. | • ඉලක්කම් දෙකේ සංඛ්‍යා 2න්, 3න් සහ 4න් බෙදීමේ ගැටලු විසඳයි.<br>• ඉලක්කම් තුනේ සංඛ්‍යා 2න්, 3න්, 4න් සහ 5න් බෙදීමේ ගැටලු විසඳයි. | • 2න්, 3න්, 4න් සහ 5න් සංඛ්‍යා බෙදීමේ ගැටලු විසඳීම | පාඩම් 9 ක්‍රියාකාරකම 1 සිට 4 | 51 සිට 55 | පැය 4 |
| | • කිලෝමීටරය සහ මීටරය අතර සම්බන්ධතාව හඳුනා ගෙන ගැටලු විසඳයි. | • විශාල දිගක් මනින ඒකකයක් ලෙස කිලෝමීටරය සහ එහි සම්මත ඒකකය හඳුනා ගෙන භාවිත කරයි.<br>• කිලෝමීටර සහ මීටර ඒකක පරිවර්තන සිදු කරයි.<br>• කිලෝමීටර සහ මීටර ඇතුළත් එකතු කිරීමේ හා අඩු කිරීමේ ගැටලු විසඳයි.<br>• මීටර සහ සෙන්ටිමීටර ඇතුළත් එකතු කිරීමේ සහ අඩු කිරීමේ ගැටලු විසඳයි. | • කිලෝමීටරය හඳුනා ගැනීම<br>• ඒකක පරිවර්තනය<br>• ගැටලු විසඳීම | පාඩම් 10 ක්‍රියාකාරකම 1 සිට 4 | 56 සිට 61 | පැය 4 |

පස්වන ශ්‍රේණිය ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| • නෝට්ටු භාවිතයෙන් කරනු ලබන ගනුදෙනුවලට අදාළ සරල ගැටලු මනෝමයෙන් විසඳයි. | • මුදල් ආශ්‍රිත සරල ගණනය කිරීම්වල නිරත වෙයි. | • මුදල් ආශ්‍රිත සරල ගණනය කිරීම් කරයි.<br>• භාණ්ඩ කිහිපයක් මිල දී ගත් විට ගෙවිය යුතු මුදල ගණනය කරයි.<br>• මුදල් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල ගණනය කරයි. | • මුදල් ආශ්‍රිත ගණනය කිරීම | පාඩම් 11<br>ක්‍රියාකාරකම 1 සිට 4 | 62 සිට 67 | පැය 4 |
| | | | | | මුළු කාලය | පැය 35 |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
## පස්වන ශ්‍රේණිය (පළමුවන වාරය)

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පස්වන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැඟීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** ක්ෝන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| • විවේකය ඵලදායි ව භාවිත කරමින් නිර්මාණශිලි ව කාර්යයක නියැළෙයි.<br>• තමා විසින් ම පිරිසිදු කර ගත් නිල ඇඳුම අභිමානයෙන් යුතු ව භාවිත කරයි.<br>• ජීවන පුරුද්දක් ලෙස ශාරීරික යෝග්‍ය ක්‍රියාකාරකම්වල නියැළෙයි.<br>• සිත් සන්සුන් කිරීමේ ක්‍රියාකාරකම්වල දිනපතා නිරත වෙයි. | (1) අපේ යහපැවැත්ම | • අන් අය සමඟ කටයුතු කිරීමෙන් තම කටයුතු සාර්ථක ව සිදු කරයි.<br>• යහගුණ අගය කරමින් ඒවා පවත්වා ගෙන යාමට කටයුතු කරයි.<br>• ශාරීරික හා මානසික යහපැවැත්ම සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • අන් අය සමඟ කටයුතු කිරීමේ දී ගැටලු ඇති නොවන ආකාරයට වචන හා ඉරියව් පාලනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි. | 2 | 16<br>17 | 2 |
| | | | • තීරණ ගැනීමේ දී කණ්ඩායමේ සැමගේ අදහස්වලට ගරු කරමින් නිවැරදි තීරණ ගැනීමේ හෝ විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමේ හෝ වැදගත්කම පැහැදිලි කරයි. | 5<br><br>3<br><br>4 | 19-.20<br><br>18<br><br>19 | 2<br><br>2<br><br>2 |
| | | | • ආදර්ශමත් පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණ විමසා බලා තම දිවි පැවැත්මට එක්කර ගත හැකි යහපත් ගුණාංග ප්‍රකාශ කරයි. | | | |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| • තමා අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගෙන යාමට ක්‍රියාශීලි ලෙස දායක වෙයි. | | | • කණ්ඩායමක් ලෙස සමාජය තුළ ක්‍රියා කිරීමේ දී පවත්වා ගත යුතු අනුගමනය කළ යුතු සිරිත් විරිත් අනුව කටයුතු කරයි. | 6 | 21 | 2 |
| | | | • ශාරීරික හා මානසික යහපැවැත්ම සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 7 | 21 | 2 |
| | | | • උපදේශනාත්මක කවිවල අර්ථය පැහැදිලි කර ගනිමින් තාලානුකුල ව ගයමින් නිරූපණය කරයි. | 10 | 24-25 | 2 |
| | | | ABOE - Song Win or Loss..... | | 192 | |
| | | | ABOE - Games | | | |

## පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| • චරිතාපදාන පිළිබඳ ව විමසිලිමත් ව අධ්‍යයනය කරමින් තම ජීවිතයට ගතහැකි ආදර්ශ ප්‍රකාශ කරයි.<br><br>• දේශීය අනන්‍යතාවයකින් යුතු භාවිත හඳුනා ගෙන ඒ පිළිබඳ අභිමානයෙන් යුතු ව පැහැදිලි කරයි. | (2) අපි ලක් වැසියෝ | • ශ්‍රී ලාංකික සංස්කෘතිය හා ජාතික උරුමයන්හි ලක්ෂණ විමර්ශනය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි.<br>• විවිධ ජනවර්ග ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ හා අනන්‍යතා අගය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි.<br>• රටේ නිදහස වෙනුවෙන් කැප කිරීම් සිදු කළ අය අගය කරමින් දේශභිමානයෙන් යුතු ව කටයුතු කරයි.<br>• තමා ජීවත් වන ප්‍රදේශයේ විවිධ කටයුතු සඳහා සහාය දක්වන ආයතන පිළිබඳ අවබෝධයක් ලබයි.<br>• ශ්‍රී ලාංකිකයන්ගේ විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව දේශීයත්වයට මුල්තැන දෙමින් විවිධ නිර්මාණ කරයි. | • ජාතික මෙන් ම අන්තර්ජාතික උත්සවවල දී ශ්‍රී ලාංකිකයෙකුගේ අනන්‍යතාව පිළිබිඹු කරන ඇඳුම් පැලඳුම් කතාබහ ආදියේ වැදගත්කම අවබෝධ කර ගනිමින් කටයුතු කරයි. | 1<br>2<br>3 | 28<br>29<br>30 | 2 |
| | | | • ජාතික උරුම කිහිපයක් පිළිබඳ තොරතුරු ගවේෂණය කර ඒ පිළිබඳ විවිධ අයුරින් තොරතුරු ඉදිරිපත් කරයි. | 4 | 31 | 2 |
| | | | • රටේ නිදහස වෙනුවෙන් කැප කිරීම් කළ විවිධ නායකයන්ගෙන් වූ සේවය අගය කරමින් වාර්තා කරයි. | 6 | 34-.36 | 2 |
| | | | • තමා ජීවත් වන ප්‍රදේශයේ ඇති පරිපාලන ආයතනයක් නිරීක්ෂණය කර එමගින් වන සේවය පිළිබඳ ව වාර්තා කරයි. | 7 | 37 | 2 |
| | | | • තම ප්‍රදේශයට ආවේණික සැරසිලි පිළිබඳ ව සොයා බලා ඉන් කිහිපයක් නිර්මාණය කරයි. | 8 | 38-.39 | 2 |
| | | | ABOE - Song We are Sri Lankans..... | | 192 | |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| 3 | (3) පැළෑටි හා ගස්වැල් | • ආසන්න පරිසරයේ පැළෑටි හා ගස්වැල්වල ලක්ෂණ හා වැඩෙන ආකාරය හඳුනා ගෙන වාර්තා කරයි.<br>• පැළෑටි හා ගස්වැල්වල වටිනාකම අගය කරමින් ඒවා රැකබලා ගැනීමට කටයුතු කරයි. | • තම පැවැත්ම සඳහා පැළෑටි හා ගස්වැල්වල ස්වභාවය වෙනස් වී ඇති ආකාරය නිරීක්ෂණය කර විශ්ලේෂණාත්මක ව වාර්තා කරයි. | 1 | 42 | 2 |
| | | | • ශාක කොටස්වල විවිධත්වය ගවේෂණය කර කරුණු ඉදිරිපත් කරයි. | 2 | 43 | 2 |
| | | | • විවිධ බීජ හා ගෙඩිවලින් වර්ගයා බෝවීම සිදු කරන ආකාරය විමර්ශනය කර වාර්තා කරයි. | 3 | 44 | 2 |
| | | | • විශේෂ අවධානයක් යොමු කළ යුතු පැළෑටි හා ගස්වැල්වල පැවැත්ම පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි. | 4 | 45 | 2 |
| | | | • වනගහනය අඩු වීම නිසා ඇතිවන අහිතකර තත්ත්ව හා ඒවා අවම කර ගන්නා ආකාර පිළිබඳ යෝජනා ඉදිරිපත් කරයි. | 5 | 46 | 2 |
| | | | • ගස්වැල්වල වැදගත්කම පිළිබඳ කියවෙන කවි, ගීත, නාට්‍ය නිර්මාණ කරමින් වින්දනයක් ලබයි. | 8 | 47 | 2 |
| | | | ABOE - Song Large Plants.....<br>ABOE - Games - Find my name | | 192 | |

### පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| 4 | (4) අප අවට සත්තු | • සතුන් පිළිබඳ මූලික තොරතුරු, සුවිශේෂ හැකියා සහ චර්යා රටා ගවේෂණය කර වාර්තා කරයි.<br>• සතුන්, ශාක හා මිනිසා සමඟ ඇති අන්තර් සබඳතා හඳුනා ගනියි.<br>• පරිසරයේ පැවැත්ම සඳහා සතුන්ගේ වැදගත්කම අගය කරමින් එම සතුන් ආරක්ෂා කර ගැනීමට දායක වෙයි.<br>• සත්ත්ව චලන පිළිබඳ චලන ගවේෂණ සහ අනුකරණ ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • පරිසරයේ වෙනස්කම් අනුව පැවැත්ම සඳහා වන සතුන්ගේ ලක්ෂණ ගවේෂණය කර තොරතුරු ඉදිරිපත් කරයි. | 1 | 50 | 1 |
| | | | • සතුන් හා මිනිසා අතර ඇති සම්බන්ධතාව අධ්‍යයනය කර වාර්තා කරයි. | 2 | 51 | 2 |
| | | | • සත්ව ගහනයේ සමතුලිතතාව රැක ගැනීම සඳහා සතුන්ගේ | 3 | 51 | 2 |
| | | | භෝජන විලාස සැකසී ඇති අයුරු විමර්ශනය කර ඉදිරිපත් කරයි. | 4 | 52 | 2 |
| | | | • ශ්‍රී ලංකාවට ආවේණික හා ආවේණික නොවන සතුන් පිළිබඳ විමර්ශනය කරමින් වාර්තා කරයි. | 5 | 53 | 2 |
| | | | ABOE - Song They are animal..... | | 193 | |
| | | | ABOE - Games - Who am I ? | | | |

## පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| • සරල උපකරණ භාවිතා කරමින් දෛනික අවශ්‍යතා ඉටු කර ගනියි.<br>• තමන්ට සේවා සපයන පුද්ගලයින් කෙරෙහි කෘතවේදී බව ප්‍රදර්ශනය කරයි. | (5) අපි පරිහරණය කරන දේ | • යම් කාර්යයක් සඳහා සුවිශේෂ භාණ්ඩ හා උපකරණ හඳුනා ගනිමින් ඒවා නිවැරදි ව, ක්‍රමානුකූල ව හා ආරක්ෂාකාරී ව පරිහරණය කරයි.<br>• අප පරිහරණය කරන භාණ්ඩයක් හෝ සේවාවක් ලබා ගැනීමේ දී හා සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>• විවිධ ස්ථානවලින් ලබා ගන්නා සේවා කාර්යක්ෂම ව හා ඵලදායී ලෙස පරිහරණය කරයි. | • පාසලේ දී හා නිවසේ දී භාවිත කරන උපකරණ නිවැරදි ව හා ආරක්ෂාකාරී ව පරිහරණය කිරීමට යොමු වෙයි.<br>• එදිනෙදා කටයුතුවල දී බලශක්තිය අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කරන ආකාරය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>• භාණ්ඩ මිල ගණන් පෙර හා පසු සසඳා අවශ්‍ය දේ පමණක් තෝරා ගනියි.<br>• ක්ෂණික ප්‍රතිලාභවලට හා අනුකරණවලට රැවටී සිදු කරන දැන්වීම් පිළිබඳ දැනුවත් භාවයෙන් යුතු ව ක්‍රියා කරයි.<br>• විවිධ ස්ථානවලින් ලබා ගන්නා සේවා කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කරයි. | 1-2<br>4<br>5<br>6<br>7-8 | 59-.60<br>62-.64<br>64<br>65<br>66 | 2<br>1<br>1<br>2<br>1 |

පස්වන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය පැය |
|---|---|---|---|---|---|---|
| | | | ABOE - Song Books in the Library.....<br>ABOE - Games - What am I ? | | 193 | |
| | | | | | මුළු කාලය | පැය 52 |

## පස්වන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| ශ්‍රේණිය | නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|
| 5 | 16-20 තෙක් සංඛ්‍යා නාම දෙමළ භාෂාවෙන් කියයි. | 16 பதினாறு පදිනාරු දහසය<br>17 பதினேழு පදිනේළු දහහත<br>18 பதினெட்டு පදිනෙට්ටු දහ අට<br>19 பத்தொன்பது පත්තෝන්බදු දහනවය<br>20 இருபது ඉරුබදු විස්ස | 1,3 | 223<br>224 | පැය 02 |
| 5 | 10-100 තෙක් දහයේ ගුණාකාර සහිත ව සංඛ්‍යා නාම දෙමළ භාෂාවෙන් කියයි. | 10 பத்து පත්තු දහය<br>20 இருபது ඉරුබදු විස්ස<br>30 முப்பது මුප්පදු තිහ<br>40 நாற்பது නාට්පදු හතලිහ<br>50 ஐம்பது ඓම්බදු පනහ<br>60 அறுபது අරුබදු හැට<br>70 எழுபது එළුබදු හැත්තෑව<br>80 எண்பது එණ්බදු අසූව<br>90 தொண்ணூறு තොණ්ණූරු අනූව<br>100 நூறு නූරු සියය | 1,2,3 | 225<br>226 | පැය 03 |
| 5 | එදිනෙදා කතාබහේ දී ස්ථානය නිශ්චිත ව දැක්වීම සඳහා සුදුසු යෙදුම් භාවිත කරයි. | மேலே මේලේ උඩ/උඩට/උඩින්<br>கீழே කීලේ යට/යටට/යටින්/බිමින්/බිම<br>உள்ளே උල්ළේ ඇතුළේ/ඇතුළට/ඇතුළෙන්<br>உள்ளே වෙළියේ එළියේ/එළියට/එළියෙන් | 1,2,3 | 227-<br>229 | පැය 02 |
| | | | | මුළු කාලය | පැය 07 |

පස්වන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| (1) | බුදුරාජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගෙන චරිතායනය කරයි. | • සත් සතිය පිළිවෙළින් නම් කරයි. | • සත් සතිය | ගුරු මාර්ගෝපදේශයේ සියලු ක්‍රියාකාරකම් | 1-.8 | පැය 4 |
| | | • බුද්ධත්වයට පත්වීමෙන් අනතුරු ව පැවැත් වූ පළමු දම් දෙසුම පිළිබඳ ව දැන ගැනීමට කැමැත්තක් දක්වයි. | • පළමු දම් දෙසුම | පෙළ පොතේ 1,2,3 පාඩම් | 1-.21 | |
| | | • බුදුරජාණන් වහන්සේ සංඝ සමාජය ආරම්භ කිරීම සිදු කළ ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරයි. | • සංඝ සමාජය ආරම්භ කිරීම | | | |
| | | • සම්බුද්ධ පරිනිර්වාණයේ අසිරිමත් සිදුවීම් පෙළගස්වයි. | • සම්බුද්ධ පරිනිර්වාණය | | | |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | ▪ ආනන්ද මහ රහතන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි උසස් ගුණාංග පිළිබඳ ව සාකච්ඡා කරයි.<br>▪ ඛේමා මහරහත් තෙරණියගේ චරිත කථාව පිළිබඳ තොරතුරු සාකච්ඡා කරයි.<br>▪ උප්පලවණ්ණා මහරහත් තෙරණියගේ චරිත කතාව පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>▪ අග්‍ර ශ්‍රාවිකා දෙනමගේ චරිතවලින් ගත හැකි ගුණාංග හඳුනා ගෙන නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>▪ අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික සේවාවන් අගයමින් කතා කරයි.<br>▪ අනගාරික ධර්මපාලතුමාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ව බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරයි. | • ආනන්ද මහරහතන් වහන්සේ<br>• අග්‍ර ශ්‍රාවිකා දෙනම<br>• අනගාරික ධර්මපාලතුමා | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් පෙළ පොතේ 8, 9, 10 පාඩම් | 9-.17<br>48-.62 | පැය 4 |

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කථා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | ▪ අභියෝග ජය ගැනීම සඳහා සමඟියෙන් යුතු ව කටයුතු කිරීමේ වැදගත්කම අගය කරමින් කතා කරයි.<br>▪ සමඟියෙන් කටයුතු කර ජයග්‍රහණය කළ ආකාරය සම්මෝදමාන ජාතකය ඇසුරින් සාකච්ඡා කරයි.<br>▪ සම්මෝදමාන ජාතකය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි. | • සම්මෝදමාන ජාතක කතාව | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම 1 පියවර 1, 2 පෙළ පොතේ 11 පාඩම | 17<br>63-.65 | පැය 3 |
| | බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව තම චර්යා මගින් ප්‍රදර්ශනය කරයි. | • තෙරුවන්ගේ ආශිර්වාද ලබා ගැනීම සඳහා දිනපතා නිවැරදි ව ජත්තමානවක ගාථා සජ්ඣායනා කරයි.<br>• නිවැරදි ව ගාථා සජ්ඣායනය කරමින් ගුරු දෙගුරුන් නමදියි. | • ජත්තමානවක ගාථා<br>• ගුරු දෙගුරුන් නැමදීම | • ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම 1 හා 2<br>• පෙළ පොතේ 4 පාඩම<br>• ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම 5, 6 | 19-.21<br>23-.26<br>24-.26 | පැය 3 |
| | | | | | මුළු කාලය | පැය 14 |

**පස්වන ශ්‍රේණිය - කතෝලික ධර්මය**

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල තුළින් අද්දකියි. තුති පුදයි. ප්‍රතිප්‍රේමය දක්වයි. | ■ ජය පරාජය සතුටින් විඳ දරා ගනිමින් සහෝදරත්වයෙන් ජීවත් වන ආකාරය ලියා දක්වයි. | යහපත් ගුණධර්ම වර්ධනය කර ගැනීම මගින්<br>සදාචාරාත්මක දිවි පැවැත්ම මගින් | පියවර 01 02 03 05<br>3 වන පාඩම<br>පෙළ පොතේ පිටු අංක 13 | 6, 7, 8 | පැය 02 |
| | | ■ පරිසරය සුරකින ආකාරය පිළිබඳ රචනාවක් ලියයි. | පරිසරය සුරැකීම හා එහි දියුණුවට දායක වීම මගින් | පියවර 01 02 04<br>4 වන පාඩම<br>පෙළ පොතේ පිටු අංක 18 | 10, 11,12 | පැය 02 |
| | මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමග කතා කරයි. | ■ ස්වාමිවාක් ආරාධනාව අවබෝධයෙන් හා බැතියෙන් ප්‍රකාශ කරයි. | ස්වාමිවාක් ආරාධනාව ඇසුරෙන්<br>දේව නමස්කාරය මගින්<br>දේව ප්‍රශංසාව<br>දේව අභිමතයට අවනත වීම<br>ස්තුති කිරීම<br>පවු කමාව යැදීම<br>අවශ්‍යතා ඉල්ලීම | පියවර 03, 04<br>5 වන පාඩම<br>පෙළ පොතේ පිටු අංක 22 | 14, 15, 16 | පැය 02 |

පස්වන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | | ■ ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා නම් කර යාච්ඤාවේ හා භාවනාවේ යෙදෙයි. | යාච්ඤාව හා භාවනාව මගින් ජේසු සමිඳුන් යාච්ඤා කළ අවස්ථා | පියවර 02 03 04 6 වන පාඩම පෙළ පොතේ පිටු අංක 26 | 19 20 | පැය 04 |
| | මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ දරුවෙකු බවට පත් වීම. | ■ ගෞරවාන්විත ව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගෙන තම වගකීම් නිසි ලෙස ඉටු කරයි. | ප්‍රසාද ස්නාපනයෙන් නව මැවිල්ලක් බවට පත් වූ අපට ප්‍රසාද නිධාන තුළ නව ජීවිතය දිව්‍ය සත් ප්‍රසාදීය ජීවිතය | පියවර 03 04 7 වන පාඩම පෙළ පොතේ පිටු අංක 30 | 23 24 | පැය 02 |
| | | ■ අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය පිළිබඳ ලියා දක්වයි. | අභිවෘද්ධි ආලේපය තුළ නව ජීවිතයක් | පියවර 02 03 04 8 වන පාඩම පෙළ පොතේ පිටු අංක 35 | 26 27 28 | පැය 02 |
| | | | | | මුළු කාලය | පැය 14 |

පස්වන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | දෙවියන් වහන්සේගේ ආදරය හා රැකවරණය අද්දකියි. ප්‍රතිපෙම දක්වයි. | ▪ ජොසප් ආගන්තුක දේශයක දී දෙවියන් වහන්සේගේ රැකවරණය ලැබූ බව අවබෝධ කර ගනිමින් කෙටි සටහනක් ලියයි. | 1) ජොසප් උත්පත්ති 41 :33 -49 | පියවර 1,2,3 පෙළ පොතේ 3 පාඩම් | 5 - 6<br>10 - 13 | පැය 02 |
| | | ▪ දෙවියන් වහන්සේ රතුමුහුද දෙබෑ කරමින් සිදු කළ ප්‍රාතිහාර්යය අධ්‍යයනය කරමින් එම සිදුවීම රඟදක්වයි. | 2) මෝසෙස් නික්මයාම 14 :15 - 31 | පියවර 1,2,3,4<br>පෙළ පොතේ 4 වන පාඩම | 7 - 8<br>14 - 16 | පැය 02 |
| | | ▪ දේබෝරා දේව මග පෙන්වීම මගින් දුන් නිවැරදි නායකත්වය පිළිබඳ අදහස් පළ කරයි. | 3) දෙබෝරා විරාවලිය 4: 4 - 8 | පියවර 1,2,3,4<br>පෙළ පොතේ 5 වන පාඩම | 9 - 10<br>17 - 19 | පැය 02 |
| | | ▪ දෙවියන් වහන්සේ අප යැදුම්වලට පිළිතුරු දෙන බව විශ්වාස කරමින් පේදුරු යාච්ඤාවෙන් දොර්කස් මරණින් නැගිටුවීමේ සිදුවීම චිත්‍ර කතාවක් මගින් ඉදිරිපත් කරයි. | 4) දොර්කස් ක්‍රියා 9 : 36 - 42 | පියවර 1,2,3,4<br>පෙළ පොතේ 6 වන පාඩම | 11 - 12<br>20 - 22 | පැය 02 |

පස්වන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | ■ යාච්ඤාවේ විවිධ අංග ඇතුළත් කරමින් යාච්ඤාවක් රචනා කරයි. | 5) යාච්ඤාව ප්‍රසංශාව<br>ක්‍රියා 16 : 25<br>ස්තුතී දීම<br>කොලො 1 : 3<br>කමාව අයැදීම<br>ගීතා 51 : 1 -2<br>අනුන් වෙනුවෙන් යැදීම<br>ක්‍රියා 13 : 3<br>පෞද්ගලික යාච්ඤා<br>ක්‍රියා 10 : 1 - 2 | පියවර 1,2,3<br><br>පෙළ පොතේ 9 වනපාඩම | 19 - 21<br><br>31 - 33 | පැය 02 |
| | ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | ■ සිමොන්ගේ නිවසේ සිදුවීම අධ්‍යයනය කරමින් එම සිදුවීම පිළිබඳ දෙබසක් රචනා කරයි. | 6) පව්කරුවෝ<br>ශු.ලූක් 7 : 36 - 50 | පියවර 1,2,3<br><br>පෙළ පොතේ 11වනපාඩම | 23 - 25<br><br>38 - 41 | පැය 02 |
| | ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | ■ ජේසුස් වහන්සේ ළදරුවන් පිළිගෙන ඔවුන්ට ආශිර්වාද කළ අවස්ථාව චිත්‍රයට නගයි. | 7) දරුවන්ට ප්‍රේමය<br>ශු. මාක් 10: 13 - 16 | පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 17වනපාඩම | 36 - 37<br><br>56 - 58 | පැය 02 |
| | | | | | මුළු කාලය | පැය 14 |